


# නොනිමි අරගලය



එලිසබෙත් මහරැජිනගේ දියමන්ති ජයන්තිය නිමිත්තෙන් බකිංහැම් මාළිගාව අබියස පැවැත්වුණු සංගීත සන්දර්ශනයේ ගායනයට ඇරියුම් ලැබුවන් අතර ඕස්ට්‍රේලියානු ආදිවාසියෙක්ද විය. ආදිවාසී තරුණියක් දෙවතාවක්ම විම්බිල්ඩන් කුසලාන දිනා ගැනීමට සමත්වූවා ය. ලෝක බොක්සිං ශූරතාව දිනූ ආදිවාසියෙක්ද ඇත . ආදිවාසීන්ගේ පාරම්පරික සම්ප්‍රදාය අනුව නිර්මාණය වන චිත්‍ර ජාත්‍යන්තර ප්‍රසාදයට පත්ව ඇත .

මේ ආකාරයට වයිවාරන්න සම්මාන හා පිළිගැනීම් ලැබුණත් අද දවසේ මේ රටේ ගම්කාරයන් වන ආදිවාසීන් ජීවත් වන්නේ සාතිශය සංවේගජනක වාතාවරණයකය. මොවුන්ගේ ආයු කාලය සෙසු ඕස්ට්‍රේලියානුවන්ට වඩා බෙහෙවින් අඩුය. ශාරීරික සෞඛ්‍යට අතින් ඔවුන්ට හිමි වන්නේ අන් සියල්ලන්ටම වඩා පහළ තත්වයකි. නිවාස හා පහසුකම් අතින් හැම ඕස්ට්‍රේලියානුවකුට ම පසු බා සිටින පිරිසකි ආදිවාසී ජනතාව. ආදිවාසී දරු දැරියන්ට ලැබෙන අධ්‍යාපන පහසුකම් හා ඉඩකඩ අතිශය සීමිතය. දුර්වල ය. විරැකියා ප්‍රශ්නය බරපතලය. මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය දැන් උග්‍ර ප්‍රශ්නයක්ව ඇත . ජෝන් හොවාඩ් යටතේ දියත් කරන ලද උතුරේ මැදිහත්වීමේ වැඩ සටහන දිගටම ක්‍රියාත්මකව පවතිද්දීය.

නොබෝදා ඇටෝර්නි ජනරාල් නිකොලා රොක්සන් විසින් ප්‍රකාශයට පත් කරන ලද ඉඩම් පනතේ විධිවිධාන සංශෝධනය කෙරෙහි අපේ අවධානය යොමු කළ යුත්තේ ඉහත දැක්වුණු පසුබිම සිත්හි දරාගෙන ය.

ඔය කියාපු විදියේ ප්‍රශ්න සහිත දුෂ්කර ජීවිතයක් ගෙවන ජනතාවකට ඉඩමක අයිතිය පිළිබඳ තහවුරුවක් දීමෙන් වන සෙත කුමක්දැයි කෙනකු අසතොත් පුදුමයට හේතු නොවිය යුතු ය. 1992 දී මහාධිකරණය විසින් ප්‍රකාශයට පත් කරන ලද ඓතිහාසික මාබෝ නඩු තීන්දුවට විසි වසරක් පිරීම නිමිතිකොට ගෙන පවත්වන උත්සව අතර මේ වාගේ ප්‍රකාශයක් කිරීමේ වැදගත්කම අවබෝධ කර ගත යුත්තේ එමගින් ලැබෙන ක්ෂණික ආර්ථික නොහොත් භෞතික වාසියක් හෝ ලාභයක් නිසා නොවේ. ඊට වඩා බලගතු යයි කිව යුතු මානසික අධ්‍යාත්මික බලයක් හා ජීවයක් ආදිවාසී ජනතාව තුළ ජනිත කිරීම ඔවුන්ගේ පරම්පරික උරුමය හා අයිතිවාසිකම් තහවුරු කොට පිළිගැනීම සමත් වන නිසා ය.

ආදිවාසී ප්‍රශ්නයේ වත්මන් තත්වයට කෙළින්ම අදාල නොවූවත් මෙහි ලා අවශ්‍යයෙන්ම අපගේ අවධානයට ලක්විය යුතු අතීත සිද්ධි මාලාවක් ඇත . මරේ දූපත් වාසියකු වූ එඩ්වර්ඩ් කොයිකි මාබෝ විසින් පවරන ලද ඉඩම් අයිතිය පිළිබඳ නඩුවත් ඒ පිළිබඳ ඓතිහාසික විනිශ්චයත් පළමුව සඳහන් කළ යුතු ය. ඊළඟට සිහිපත් කළ යුතු ඓතිහාසික අවස්ථාවක් හා ප්‍රකාශයක් ඇත . මාබෝ තීන්දුව දෙන්නට ආසන්න අවදියේ එවක අගමැතිව සිටි කම්කරු පක්ෂයේ පෝල් කීටිං විසින් පවත්වන ලද රෙඩ්ෆර්න් දේශනය දෙවනුව සිහිපත් කළ යුතු ය. අපි ආදිවාසීන්ගේ ඉඩම් උදුරාගත්තා - අපි ඔවුන්ගේ දරුවන් පැහැරගත්තා - අපි ඔවුන්ට එතෙක් නොතිබුණ ලෙඩ රෝග බෝ කළා - ආදි වශයෙන් එදා ඔහු කළ කතාව කිසිදු නායකයකු විසින් නොකරන විදියේ අවංක පාපොච්චාරණයක් විය.

රෙඩ්ෆර්න් දේශනයේ අගය කැපී පෙනෙනුයේ ඊළඟ වසරේ ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද ඓතිහාසික මාබෝ පනත හා එදින විපක්ෂ නායකයා කළ ප්‍රකාශයක් ද නිසා ය. එවකට විපක්ෂ නායක පදවිය දරුවේ ආචාර්ය ජෝන් හියුසන් ය. ඔහු හා පක්ෂය පනතට විරුද්ධ වූවා පමණක් නොවේ. පනත සම්මත කරන දිනය ඕස්ට්‍රිලියාවට කනගාටුදායක

> *වරින්වර ලිබරල් හා කම්කරු පාලකයන් විසින් යෝජනා කොට දියත් කරනු ලබන සංවර්ධන වැඩ සටහන් කිසිවක් ආදිවාසීන්ගේ මූලික ප්‍රශ්න කිසිවක් හරි හැටි විසඳීමට සමත්ව නැත .*

දිනයක් වන බව පවා අවධාරණය කිරීමට තරම් ඔහු සාහසික වූයේ ය. ඒ අවස්ථාව අප සිහිපත් කළ යුත්තේ ඒ ප්‍රකාශයේ බරපතළකම අවධාරණය කරමිනි.

අපි ඔවුන්ගේ දරුවන් පැහැර ගත්තා යයි එදා පෝල් කීටිං කිවේ ආදිවාසීන්ට සුදු පාලකයන් කළ එක් අසාධාරණයක් ගැන ය. ඒ පිළිබඳ විමසනු වස් පත්කරන ලද කොමිසම විසින් ඒ වෙනුවෙන් රජය කනගාටුව ප්‍රකාශ කළ යුතු බව කීව ද වාර්තාව බාර දෙන විට සිටි අගමැති ජෝන් හොවාඩ් එය එකහෙළාම ප්‍රතික්ෂෙප කළේ ය. ඒ ඓතිහාසික පියවර ගැනීමට නැවත කම්කරු රජයක් එන තෙක් බලා සිටින්නට සිදුවිය. 2000 දී බලයට පත් කම්කරු රජයේ නායක අගමැති කෙවින් රඩ් විසින් එම නිර්දේශය ක්‍රියාවට නැංවූ දිනය ද ඉතිහාසගතවන්නකි. ඒ 2009 පෙබරවාරි 19 වැනි දින ය. පුදුමයකට හා වාසානාවකට එදා විපක්ෂ නායක පදවිය හෙබවූයේ වඩා සාමකාමීයකු යයි කිව යුතු බ්‍රෙන්ඩන් නෙල්සන් නමැති වෛද්‍යවරයාය. ඔහු අගමැති සමග යට කී කනගාටුව ප්‍රකාශ කිරීමට පසුබට වූයේ නැත . එය අගය කළ යුත්තේ ඒ දිනයේ පාර්ලිමේන්තුවට පැමිණි හිටපු අගමැතිවරුන් අතර ජෝන් හොවාඩ් නොසිටි නිසා ය. විට්ලම්. හෝක්. කීටිං. යන හිටපු කම්කරු අගමැතිවරුන් පමණක් නොව හිටපු ලිබරල් අගමැති මැල්කම් ෆ්‍රේසර් ද එදින පැමිණ සිටියේ ය. ජෝන් හොවාර්ඩ් හෙල්ලුනේ නැත .

අද සාන්තුවරයකු ලෙසින් පෙනී සිටින ඔහුගේ අනුප්‍රාප්තිකයකු වන ටෝනි ඇබට් එහෙම දවසක සිටියා නම් සහභාගිවනවා ඇද්ද යන ප්‍රශ්නය මතු කිරීම වටිනවා ය.

මේ සියල්ල අතීතයට හිමි වන සිද්ධි ජයග්‍රහණ සහ අභියෝග ය.
අද අවශ්‍යව ඇත්තේ ආදිවාසීන්ගේ ජීවන තත්වය හා අනාගතය වඩා සතුටුදායක වන ආකාරයට අවශ්‍යයෙන්ම ඉටු කළ යුතු වගකීම් හා යුතුකම් නොවළහා ඉටු කිරීම ය.

එය අවධාරණය කළ යුත්තේ මුලින් සඳහන් කළ ආකාරයෙන් ඔවුන්ට ලබා දෙන පිළිගැනීමේ අභිමානය සහ ආත්ම ගෞරවය හුදු ආභරණයක් හෝ ආටෝපයක් පමණක් වීම නිර්ථක ප්‍රදර්ශනයක් වීම නිසා ය. ආදිවාසී ප්‍රශ්නය නොහොත් සියවස් දෙකකට අධික කාලයක් තිස්සේ ඔවුන් ගෙන ගිය අරගලය අදත් කොච්සඳී නිම නොවී දිග්ගැස්සෙමින් පවතී. වැය කරන ලද කෝටි ගණනක මුදලින් ලැබුණු ප්‍රතිලාභයක් නැති තරම් ය. වරින්වර ලිබරල් හා කම්කරු පාලකයන් විසින් යෝජනා කොට දියත් කරනු ලබන සංවර්ධන වැඩ සටහන් කිසිවක් ආදිවාසීන්ගේ මූලික ප්‍රශ්න කිසිවක් හරි හැටි විසඳීමට සමත්ව නැත .

කොමිෂන් සභා සහ විවිධ විමර්ශන කිසිවකින් ගැම්මක් ඇති මෙහෙයක් අද දක්වා සිදුවී නැති බව වගකිව යුත්තන් පිළිගත යුතු ය. ඒ යථාර්ථය වටහා ගත් තරමට ඉදිරි පියවර ගැන ක්‍රියාත්මක වීමද පහසු වනු ඇත . ප්‍රශ්න තරමටම විසඳුම් දෙන විශේෂඥයන් ද ඇති බව පෙනෙයි. ගැටලුව ඒ කිසිවකු කරන කිසිදු පිළියමකින් රෝගියා සුවපත් නොවීම ය.

සමස්ත ඕස්ට්‍රේලියානු ජනතාවම මේ පිළිබඳව කම්පාවට පත් විය යුතු යයි සිතමි. ආදි වාසීන් දුක් විඳිනවා කියන්නේ මේ රටේ මුල් තැන ලද යුතු අන් සියල්ලන්ටම වඩා වැදගත් තැනක ගර්වාන්විතව පෙනී සිටිය යුතු - ක්‍රියා කළ යුතු - මූලික කණ්ඩායම පසුබෑම ය. ජෝන් හොවාඩ් යුගයේ කොන් කරන ලද ලුවිජා ඕ ඩොනාහු. බඳඅසළුවි ධ.ඃදබදටයමැ පැට් ඩොඩ්සන් ජ්වරසජන ඃදිාදබ බඳු ආදිවාසී නායකයන්ගේ පූර්ණ සහයෝගය ලබා ක්‍රියාවට නගන පුළුල් වැඩ පිළිවෙලක අවශ්‍යතාව පැහැදිලිව පෙනී යන යුගයකි අද අප ඉදිරියේ ඇත්තේ. නිලධාරි පැලැන්තියකට වගකීම පවරා ඉටු කර ගත හැකි කාර්යභාරයක් නොව ස්තානගත ලොකු කුඩා ාසියලු දෙනාම හවුල් කර ගෙන ඔවුන්ගේ උද්‍යොගය පිරිහෙන්නට ඉඩ නොදී ක්‍රියාත්මක කළ යුතු මහා ජාතික මෙහෙවර මුලින් සඳහන් කළ සකලවිධ ඌනතා සහ අවශ්‍යතා පිරිවසාලන ව්‍යායාමයක් බලධාරීන් සහ පොදු ජනතාව විසින් ද ඉටු කරනු ලැබිය යුතු බව අවධාරණය කරමු.


**MONT ALBERT DENTISTS P/L**

**For all Your Dental Requirements**

We Provide

**GENERAL DENTAL TREATMENT**
**COSMETIC DENTAL**
**TEETH WHITENING**
**PARTIAL/FULL DENTURES**
**EMERGENCY SERVICES**

WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.

**FOR APPOINTMENTS**
**9890 3609**

**DISCOUNTS FOR FAMILIES, FREE CHECK UPS FOR KIDS UNDER 7 YEARS**

**DR. ENOKA JAYATILAKEBANDA (BDS)**

**MONT ALBERT DENTISTS**

2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)